DOI: 10.31357/fhssmst.2009.00044

# ව්‍යාපෘතිකරණය සහ සන්නිවේදනය

**සෝමසිරි ඒකනායක**

**ලි. ප. අ. GS/HU/1615/2002**

27 NOV 2009

"ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය

සඳහා ජනසන්නිවේදනය විෂය යටතේ ඉදිරිපත් කරන නිබන්ධයයි "

# උපාධි අපේක්ෂකයාගේ ප්‍රකාශය

මේ ශාස්ත්‍රීය නිබන්ධය මහාචාර්ය තිස්ස කාරියවසම් මහතාගේ සුපරීක්ෂණය යටතේ මා විසින් සම්පාදනය කරන ලද බවත්, මේ පරීක්ෂණය කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ වෙනත් විශ්වවිද්‍යාලයකට හෝ ආයතනයකට හෝ වෙනත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් සඳහා ද ඉදිරිපත් නොකරන ලද බවත් සහතික කරමි.

.......................................
2009.11.27

සෝමසිරි ඒකනායක

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
30 NOV 2009

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
27 NOV 2009

## උපදේශකගේ / උපදේශකයන්ගේ සහතිකය

මේ අපේක්ෂකයා විසින් කරන ලද ප්‍රකාශය සත්‍ය බවත්, මේ නිබන්ධය ඇගැයීම් කාර්යය සඳහා විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කිරීමට සුදුසු බවත් නිර්දේශ කරමි.

.......................................................

උපදේශකගේ අත්සන

පටුන පිටුව


1 හැඳින්වීම 1

1.1 නිබන්ධනයේ පසුබිම: (***Background***) 1

1.2 දළ විශ්ලේෂණය ***(Overview)*** 4

1.2.1 සන්නිවේදනය 4

1.2.2 ව්‍යාපෘතිකරණය 5

1.2.3 ව්‍යාපෘතික සන්නිවේදනය (*Project Communication*) 5

1.3 අධ්‍යන ක්ෂේත්‍රය (***Statement of the Problem***) 6

1.4 අභිප්‍රාය ***(Significant*** 7

**1.5** වාද විෂය ***(The Issue)*** 8

**1.6** පර්යේෂණ අවශ්‍යතාවය, විෂය හා සීමාව සහ පර්යේෂණ රාමුව 8

***(Research Requirement, Scope & Limitation of The Research***

***And Research Framework)***

1.6.1 අධ්‍යයනයේ සීමා 9

1.6.2 අධ්‍යනයේ අරමුණු (*Objective of the Research*) 10

1.6.3 උපන්‍යාස ගොඩනැංවීම *(Statement of the Research)* 10

**1.7** සාහිත්‍ය අධ්‍යයනය ***(Literature Review)*** 11

1.8 ක්‍රමවේදය (***Methodology)*** 11

1.8.1 ප්‍රාථමික මූලාශ්‍ර 11

1.8.2 ද්විතීයික මූලාශ්‍ර 12

1.9 නියැදිය (***The sample***) 12

| | | | |
|---|---|---|---|
| | 1.10 | දත්ත විශ්ලේෂණය *(Data Analysis)* | 13 |
| | 1.11 | පරිච්ඡේද සංක්ෂිප්තය *( The Chapter Outline)* | 13 |
| ***2.*** | **සාහිත්‍ය විමර්ශනය** | | 15 |
| 2.1 | **හැඳින්වීම** | | 15 |
| 2.2 | **සන්නිවේදනය (*Communication)*** | | 15 |
| | 2.2.1 | හැරල්ඩ් ඩී ලැස්වෙල් (*Harold D.Lasswell*) ආකෘතිය | 16 |
| | 2.2.2 | විල්බර් ශ්‍රාම් *(Wilbur Schramm /* චාල්ස් ඔස්ගුඩ් ආකෘතිය *(Charls Osgood)* | 16 |
| | 2.2.3 | ක්ලෝඩ් ෂැනොන් (*Clude E. Shannon*) හා වොරන් වීවර් ආකෘතිය *(Warren Weaver)* | 18 |
| | 2.2.4 | බෲස් වෙස්ට්ලි (*Bruce H. Westley*) හා මැල්කම් මැක්ලීන් (*Malcom S. Maclean)* ආකෘතිය | 19 |
| 2.3 | **ව්‍යාපෘතියක් යනු කුමක්ද *(What is the Project)*** | | 20 |
| 2.4 | **ව්‍යාපෘතියක අදියරයන් ( *Steps of the Project*)** | | 22 |
| | 2.4.1 | ව්‍යාපෘති හඳුනා ගැනීම (*Project Identification)* | 24 |
| | 2.4.2 | ව්‍යාපෘතිය සැකසීම (*Project Preparation*) | 26 |
| | 2.4.3 | ව්‍යාපෘතිය තක්සේරු කිරීම (*Project Appraisal*) | 27 |
| | 2.4.4 | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම *(Project Implementation)* | 28 |
| | 2.4.5 | ව්‍යාපෘති ඇගයීම *(Project Evoluation)* | 29 |
| **2.5** | **ව්‍යාපාති කළමණාකරණය (*Project Management)*** | | 30 |
| | 2.5.1 | වැඩ ප්‍රභේදන ආකෘතිය (*Work Breakdown Structure)* | 31 |
| | 2.5.2 | කාර්යය සැලසුම් ක්‍රමවේදය (*Work Plan – Gantt Chart*) | 32 |
| | 2.5.3 | තර්ක රාමු එළඹුම (*Logical Freamework Approach*) | 33 |
| 2.6 | **ව්‍යාපෘතික සන්නිවේදන සැලසුම්** | | 35 |

**(*Project Communication Plan*)**

2.6.1 ව්‍යාපෘතික සන්නිවේදන ප්‍රවාහය 36

*(Project Communication Flow)*

2.6.2 ආදර්ශ ව්‍යාපෘති සන්නිවේදන සැලසුමක් 39

2.6.3 ව්‍යාපෘතික සන්නිවේදනය මගින් ජය ගත හැකි ගැටළු 40

**2.7 ගම නැගුම සංවර්ධන වැඩසටහන 42**

2.7.1 වැඩ සටහන විකාශනය වීම 45

**3. ක්‍රමවේදය 47**

**3.1 හැඳින්වීම 47**

**3.2 දත්ත රැස් කිරීමේ ක්‍රම වේදය 47**

**3.3 සමීක්ෂණ නියැදිය 49**

**3.4 දත්ත විශ්ලේෂණය 49**

***4. විශ්ලේෂණය*** 51

**4.1 හැඳින්වීම 51**

**4.2 ගම නැගුම මෙහෙයුම් ක්‍රියාවලිය 51**

**4.3 ගම නැගුම ක්‍රියාත්මක යාන්ත්‍රණය 53**

**4.4 ගම නැගුම ව්‍යාපෘතියේ සන්නිවේදනය 56**

4.4.1 ගම නැගුම චක්‍රලේඛ හා උපදෙස් 57

4.4.2 ගම නැගුම ජාතික ප්‍රගති සමාලෝචන කමිටුව 58

4.4.3 දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටුව 58

4.4.4 ප්‍රාදේශිය සම්බන්ධිකරණ කමිටුව 59

4.4.5 ජන සභාව 60

4.4.6 ගම නැගුම වෙබ් අඩවිය www.gamanaguma.info 61

**4.5 ගම නැගුම සන්නිවේදන සැලසුම 63**

**4.6 ගම නැගුම සංවර්ධන ව්‍යාපෘතියේ අභ්‍යන්තර සන්නිවේදන 64**

**ක්‍රියාවලියේ දී හමු වන විවිධ පසු තලයන්**

**හා ඒවායේ ක්‍රියාකාරීත්වය**

**5. නිරීක්ෂණ සහ සොයාගැනීම් 70**

**5.1 හැඳින්වීම 70**

**5.2 සන්නිවේදන ගලනය සහ ප්‍රගති වාර්තා 70**

**5.3 සංවර්ධන ප්‍රයත්නය 79**

5.3.1 සංවර්ධන සම්ප්‍රජානතාවය 79

5.3.2 සංවර්ධන අසහනය 83

5.3.3 සංවර්ධන අභිප්‍රේරණය 83

**5.4 සංවර්ධනය සඳහා වන ජන සහභාගීත්වය හා 86**

**ගම නැගුම ව්‍යාපෘතිය.**

**5.5 සංවර්ධනය සඳහා වන ජන රැඳියාව 89**

**6. සමාලෝචනය 92**

**6.1 හැඳින්වීම 92**

**6.2 නිගමන 92**

**6.3 ගැටළු 94**

**6.4 යෝජනා 96**

**ආශ්‍රිත ග්‍රන්ථ 99**

**ඇමුණුම්**

i. Princeton Project Methodology -- Project Communication Plan

ii. ගම නැගුම සංවර්ධන වැඩසටහනට අදාළව නිකුත් කර ඇති චක්‍රලේඛ හා උපදෙස්

iii. ගම නැගුම සන්නිවේදන සැලසුම

iv. ගම නැගුම සන්නිවේදනය ප්‍රවාහය

v. ගම නැගුම සංවර්ධන වැඩ සටහන පිළිබඳව සරල සමීක්ෂණ ප්‍රශ්නාවලිය

**රූප සටහන් සහ දත්ත වගු නාමාවලිය** **පිටුව**


| | | |
|---|---|---|
| i | හැරල්ඩ් ජේ ලැස්වෙල් ආකෘතිය | 16 |
| ii | ශ්‍රාම් - ඔස්ගුඩ් ආකෘතිය | 17 |
| iii | ෂානොන් - වීවර් ආකෘතිය | 19 |
| iv | වෙස්ට්ලි - මැල්කම් ආකෘතිය | 19 |
| v | ව්‍යාපෘතික සාධක | 22 |
| vi | Baum's ගේ ව්‍යාපෘති චක්‍රය | 23 |
| vii | *Randinelli's* ව්‍යාපෘති චක්‍රය | 24 |
| viii | ව්‍යාපෘති හඳුනා ගැනීම | 26 |
| ix | *Target Chasing Exercise* | 29 |
| x | *වැඩ ප්‍රභේදන ආකෘතිය* | 31 |
| xi | *WBS detail sheet* | 32 |
| xii | work plan detail | 33 |
| xiii | Logical Framework | 34 |
| xiv | පසු තලයන් අනුව සන්නිවේදනයේ ස්වභාවය | 38 |
| xv | ප්‍රින්සෙටන් ව්‍යාපෘති ක්‍රමවේදය | 39 |
| xvi | ගම නැගුම සංවර්ධන කළාප බෙදීම | 52 |
| xvii | ගම නැගුම සංවිධාන ව්‍යුහය | 53 |
| xviii | ගම නැගුම පසුතලයන් අතර සන්නිවේදන ප්‍රවාහයේ ලක්ෂණ (පළමු පසු තලයේ සිට හතරවන පසුතලයට) | 65 |

| | | |
|---|---|---|
| xix | පසුතලයන් අතර සන්නිවේදන ප්‍රවාහයේ ලක්ෂණ (සිව්වන පසු තලයේ සිට පළමුවන පසුතලයට) | 68 |
| xx | සංවර්ධන නිලධාරීන් සහ ප්‍රජාව අතර තොරතුරු ගලනය | 71 |
| xxi | පණිවුඩ/ තොරතුරු බර තැබීම | 72 |
| xxii | ප්‍රාධාන සංරචකය අනුව ව්‍යාපෘති බෙදී යාම | 73 |
| xxiii | උප සංරචකය අනුව ක්‍රියාත්මක ව්‍යාපෘති සංඛ්‍යාව | 75 |
| xxiv | ගම නැගුම පසුතලයන් අතර පණිවුඩ අර්ථ කථනය කිරීම | 77 |
| xxv | ගම නැගුම තුළ දොරටුපාල ක්‍රියාවලිය | 78 |
| xxvi | සමීක්ෂණ තොරතුරු - දැනුවත් වීම | 80 |
| xxvii | සමීක්ෂණ තොරතුරු - දැනුවත් වීමේ මාධ්‍ය | 81 |
| xxviii | සමීක්ෂණ තොරතුරු - කරුණු අවධාරණය කිරීම | 82 |
| xxix | සමීක්ෂණ තොරතුරු - නිලධාරී සහභාගීත්වය | 85 |
| xxx | ගම නැගුම තෙවන පසු තලයෙන් සන්නිවේදනය ඛණ්ඩනය වීම | 85 |
| xxxi | සමීක්ෂණ තොරතුරු - ගම නැගුම ජන සහභාගීත්වය | 87 |
| xxxii | ගම නැගුම - ජනසහභාගීත්වය අවම වීමට හේතු | 88 |
| xxxiii | ගම නැගුම - දැනුවත් කිරීමේ මට්ටම | 89 |
| xxxiv | සමීක්ෂණ තොරතුරු - ගම නැගුම ජන රැඳියාව | 90 |

ස්තුතිය...........

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ජනසන්නිවේදනය විෂය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව වෙනුවෙන් ඉදිරිපත් කෙරෙන මෙම නිබන්ධනය සම්පාදනය කිරීමේ දී නන් අයුරින් සහාය දැක්වූ කිහිප දෙනෙකු මෙහි දී සිහිපත් කළ යුතුය.

මෙම පාඨමාලාවේ සමායෝජක ලෙස කටයුතු කරමින් ඵලදායි ලෙස අධ්‍යයන ක්ෂේත්‍රයන් තෝරා ගැනීම වෙනුවෙන් අප මෙහෙය වූ සහ අධ්‍යයනයේ සුපරීක්ෂක ලෙස කටයුතු කළ මහාචාර්ය තිස්ස කාරියවසම් මහතාත්, විවිධ ක්ෂෙත්‍රයන් ඔස්සේ වන තම දැනුම හා අත්දැකීම් අප සමග නොමසුරුව බෙදා හදාගත් මහාචාර්ය ධම්මික ගංගානාත් දිසානායක මහතා, සේනානි හරිශ්චන්ද්‍ර මහතා ඇතුළු ආචාර්ය මණ්ඩලය පළමුවෙන්ම සිහිපත් කළ යුතුය.

මෙම අධ්‍යයන කාර්යය සිදු කිරීමේ දී අදාළ මූලාශ්‍ර සොයා ගැනීමේදී මා හට සහාය දැක්වූ ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ අනූෂා, සුදත් සහ අප්සරා යන සොයුරු සොයුරියන් ද, දත්ත රැස්කිරීමේ කාර්යයේ දී සහාය දැක්වූ නිලන්ත සහ මධුර යන සොයුරන් ද සිහිපත් කරන්නේ හද පිරි සතුටිනි.

එමෙන්ම මෙම කටයුත්ත ආරම්භයේ සිටම නිරන්තරයෙන් අදහස් හුවමාරු කරමින් මා දිරිමත් කළ කපිල සහ ආනන්ද සොයුරන් ද, විවිධ රාජකාරී කටයුතුවල දී හමු වී මාගේ මෙම අධ්‍යයන පරමාර්ථය දැන හෝ නොදැන, මා හා සකච්ඡා කරමින් මෙම අධ්‍යයනයේ ද්විතීයික මූලාශ්‍ර බවට පත් වූ සංවර්ධන ක්ෂේත්‍රයේ කටයුතු කරන නිලධාරීන් කිහිප දෙනෙකුම මට මෙහිදී සිහිවේ.

මෙම කාලය තුළ මා මෙම අධ්‍යයන කටයුත්තට මුදා හරිමින් කුටුම්බයේ කුදු මහත් රාජකාරී ද ඉටු කරමින් සියලු ක්‍රියයන්හි දී මට සහය වන ධම්මී නොවන්නට මෙම කාර්යය ද කිසිදා අවසන් නොවනු ඇත.

"ව්‍යාපෘතිකරණය සහ සන්නිවේදනය"

සෝමසිරි ඒකනායක

## නිබන්ධ සාරාංශය

දශක කිහිපයක් තිස්සේ අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලැබූ මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් ගණනාවකින් පසුව ද ලංකාව ඇතුළු තෙවන ලොව රටවල් සිය සංවර්ධන අපේක්ෂාවන් මුදුන්පත් කර ගැනීමට අපොහොසත්ව ඇති බවත්, බොහෝ සංවර්ධන ව්‍යාපෘතීවල ශේෂයන් ලෙස උරුම වී ඇති ප්‍රාදේශිය සංවර්ධනයේ විෂමතාවයන් ඉවත් කිරීමට කටයුතු කිරීම කඩිනම් අවශ්‍යතාවයක්ව පවතින බවත් එම රටවල්වල රජයන් විසින් මේ වන විට පිළිගෙන ඇත.

මේ සඳහා පිළියම් ලෙස යෝජනා වී ඇත්තේ ඉහළ සිට පහළට ක්‍රියාත්මක වූ සාම්ප්‍රදායික සංවර්ධන මොඩලයට ප්‍රතිවිරුද්ධව පහළ සිට ඉහළට ක්‍රියාත්මක වන විකල්ප සංවර්ධන ක්‍රියාදාමයකට යොමු වීමය. එසේත් නොමැති නම් ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක වූ සංවර්ධන ව්‍යාපෘති විසින්ම සංවර්ධන ක්‍රියාදාමයෙන් ඈත් කොට තිබූ ජනතාව සංවර්ධනයේ කොටස්කරුවන් බවට පත් කිරීමය.

මෙම නව එළඹුම විසින් එක් පසෙකින් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී ජනතා සහභාගීත්වය අපේක්ෂා කරන අතර ඊට අදාළව පුළුල් මට්ටමේ කතිකාවක් ගොඩ නැගිය යුතු බවට ද අදහසක් පවතී. "සංවර්ධන ව්‍යාපෘති සඳහා සන්නිවේදනය" යන්න දැඩිව අවධාරණය වෙමින් පවතින්නේ මෙම තත්වය තුළය.

සංවර්ධන ව්‍යාපෘතිය සහ ඒ තුළ වන සන්නිවේදන සැලසුම කෙතරම් දුරකට ඓන්ද්‍රියව බැඳී පවති ද යන්න ලංකාව තුළ මෙතෙක් සන්දර්භගත කොට නොමැත. ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති අපේක්ෂිත අරමුණු, පරමාර්ථ හා ඉලක්ක කරා ළඟා නොවීමට බලපාන ලද විවිධ කරුණු අතරින් ප්‍රධානම හේතුවක් ලෙස එම සංවර්ධන ව්‍යාපෘති ජනතාව

සමග බද්ද කිරීම වෙනුවෙන් ක්‍රියාත්මක කරන ලද සන්නිවේදන උපාය මාර්ගවල දිළිඳුබව හඳුනා ගනු ලබන අතර මෙම නිබන්ධනයේ විශ්ලේෂණ රාමුව සකස් කරන්නේ එම ගැටළුවයි.

ඒ අනුව මෙම අධ්‍යයනයේ විෂය ක්ෂේත්‍රය ලෙස ලංකාවේ මේ වන විට ක්‍රියාත්මක වන ප්‍රමුඛතම විලක්ප සංවර්ධන එළඹුම වන ''ගම නැගුම'' වැඩ සටහන සැලකිල්ලට ලක් කරමින් ඒ තුළ වන සන්නිවේදන සැලසුම කෙතෙක් දුරට එම වැඩ සටහනේ අපේක්ෂිත අරමුණු, පරමාර්ථ හා ඉලක්ක කරා ළඟා වීමට ඉවහල් වී තිබේ ද යන්න විමර්ශනයක යෙදෙයි.

සෑම සාර්ථක සංවර්ධන ව්‍යාපෘතියකම සාර්ථක සන්නිවේදන සැලසුමක් ක්‍රියාත්මක වන බව මෙම අධ්‍යයනය මගින් තහවුරු කෙරේ. සුවිශේෂි ලෙස ගම නැගුම වැඩසටහන තුළත් පොදුවේ ඕනෑම සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේ දී ද සන්නිවේදන සැලසුම්වල ඇති ක්‍රමෝපායික වැදගත්කම අවධාරණය කිරීම මෙහි මූලික අපේක්ෂාවකි.

# පළමුවන පරිච්ඡේදය

## හැඳින්වීම

### 1 නිබන්ධනයේ පසුබිම: (*Background*)

සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සහ සන්නිවේදනය අතර වන සෘජු හා දැඩි සම්බන්ධය පසුගිය දශක දෙකකට ආසන්න කාලය තුළ විශේෂ අවධානයට ලක් වෙමින් පවතින ප්‍රපංචයක් පවට පත් වී ඇත. තෙවන ලොව රටවල් විසින් ජාත්‍යන්තර සංවිධාන වලද සහාය ඇතිව ශීඝ්‍ර සංවර්ධනය හා ප්‍රාදේශිය වශයෙන් පවත්නා සංවර්ධනයේ විෂමතාවයන් ඉවත් කරීම වෙනුවෙන් ක්‍රියාත්මක කරනු ලැබූ සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය ලෙස තව තවත් ප්‍රාදේශිය සංවර්ධනයේ විෂමතාවය (*Regional Development Disparity*) වර්ධනය වී අති බව එකී සංවර්ධන වැඩ සටහන් වලට අධාර ලබා දෙන ලද සංවිධාන විසින් තහවුරු කොට ඇතිවා පමණක් නොව අදාළ රටවල් විසින් ද මෙම තත්වය පිළිගෙන ඇත.

එක්සත් ජාතීන්ගේ සංවිධානය, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව වැනි ජගත් සංවිධාන පමණක් නොව, කළාපීය වශයෙන් වාර්ෂිකව රැස්වන සියලුම සමුළුවලත් ආරම්භයේ සිට අද දක්වාම වාර්ෂිකව අවධානය යොමු කරනු ලබන කරුණකි, සංවර්ධනය. සංවර්ධනය අපේක්ෂිත මට්ටම්වලට ළඟා නොවීම හෝ ප්‍රාදේශිය වශයෙන් වන සංවර්ධනයේ අසමතුලිත බව වර්ධනය වීම යන කරුණු වලින් අවධාරණය වන්නේ අන් යමක් නොව, අදාළ සංවර්ධන ඉලක්කයන් අත් පත් කර ගැනීම වෙනුවෙන් ක්‍රියාත්මක කරන ලද අනේක විධ සංවර්ධන වැඩසටහන්වල පවතින යම්කිසි ගැටළුකාරී තත්වයකි. කුමන හෝ හේතුවක් මත අදාළ සංවර්ධන වැඩසටහන් අපේක්ෂිත අරමුණු (*Goal*), පරමාර්ථ (*Objective*), හා ඉලක්ක (*Target*) කරා ළඟා වීමට අපොහොසත් වී ඇත.

ලංකාවේ දිළිඳුකම පිටු දැකීමේ වැඩසටහන්වල ප්‍රතිඵල පිළිබඳව ඇගයිමක යෙදෙන 2007 ලෝක බැංකු වාර්තාව මෙසේ සඳහන් කරයි.

*" Poverty in Sri Lanka is marked by spatial heterogeneity. The poverty headcount ratio in Colombo District in 2002 (6 percent) was less than a sixth of the*

*ratios in Badulla and Monaragala Districts (37 percent). The regional disparity in the pace of poverty reduction is even more striking. The poverty headcount ratio in Colombo District declined by 10 percentage points between 1990–91 and 2002, while the ratio in Puttalam District rose by almost 10 percentage points during the same period........".*[1]

මේ අනුව ලංකාවේ අග නගරය වන කොළඹ සහ පරිධියේ (*periphery*) දිස්ත්‍රික්කයන් අතර පෙන්නුම් කෙරෙන මෙම සංවර්ධනයේ විෂමතාවය තේරුම් ගත යුත්තේ කෙසේද ? එකම කාල පරිච්ඡේදයක් තුළ කේන්ද්‍රය (*central)* විසින් දිළිඳුකමේ සීමාව අඩුකර ගන්නා ප්‍රතිශතයට සමාන වන පරිද්දෙන් පරිධියේ (*periphery)* ප්‍රදේශවල දිළිඳුකම වර්ධනය වන්නේ කෙසේද? ලෝකයේ දිළිඳුකම ශීඝ්‍රයෙන් වර්ධනය වූ රටක් ලෙස ශ්‍රී ලංකාව හඳුනාගනු ලැබ ඇත්තේ මෙම තත්වය තුළය.

ලෝක බැංකුව (*World Bank)* විසින් ඉදිරිපත් කර ඇති මෙම තත්වය තහවුරු කෙරෙන තවත් ප්‍රකාශයක් *Mahinda Chinthana : Vision For A New Sri Lanka, Discussion Paper On Development Framework 2006-2016* තුළින්ද හඳුනාගත හැකිය. ඒ අනුව ලංකාව තුළ පසුගිය වසර විසි පහක් තිස්සේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ප්‍රතිපත්ති තුළින් දළ දේශීය නිශ්පාදිතය (*GDP*) වාර්ෂිකව 5% කින් වර්ධනය වුවද මෙම වර්ධනයේ ප්‍රතිලාභ පොදුවේ රටේ සියලුම ජනතාවට ලැබී නැති බව ප්‍රකාශ කරයි.

එනම් ලංකාව තුළ සිදු වී ඇති සංවර්ධනය දෙදිසාවකට ගමන් කර ඇත. කේන්ද්‍රය (central) විසින් සිය සංවර්ධනය වර්ධනය කර ගන්නා අතර පරිධිය (periphery) විසින් සිය ඌණ සංවර්ධනය වර්ධනය කරගෙන ඇත.

*"........... It is clear that in the past the economic growth has largely bypassed the rural areas and concentrated in the Western province, which now contributes a 51 percentage for the national GDP (2004)........... "*[2]

ඕනෑම රටක සංවර්ධන ක්‍රියාවලිය ගලා යන්නේ නිශ්චිත ක්‍රමවේදයකට අනුවය. සංවර්ධනයේ පුළුල් අරමුණු කරා ළඟා වීම වෙනුවෙන් ප්‍රතිපත්ති සම්පාදනය කරනු ලබන